


★

# දිනමිණ


The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ බක් පුර පසළොස්වක ලත් සඳු දින | කාණ්ඩය 112 | පත්‍රය 110 | පිටු 24 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 අප්‍රේල් 26 සඳුදා







## විධිමත් එන්නත්කරණ වැඩපිළිවෙළක් රජය සතුයි

නුවන් කොඩිකාර

කොවිඩ් 19 වසංගත උවදුරට අවසන් විසඳුම එන්නත්කරණය පමණක් බවත් ජනතාවට එන්නත ලබාදීම සඳහා සැකසූ විධිමත් වැඩපිළිවෙළක් රජය සතුව තිබෙන බවත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අවධාරණය කළේය.

පිට 06

## රිෂාඩ්-රියාජ් දින 90ක් රඳවා ප්‍රශ්න කරන්න CIDය සූදානම් වෙයි





සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත

හිටපු ඇමැති රිෂාඩ් බදියුදීන් සහ ඔහුගේ සොහොයුරකු වන රියාජ් බදියුදීන් දින 90ක කාලයක් රඳවා ප්‍රශ්න කිරීමට අධිකරණ නියෝග ලබා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සූදානම් වෙයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ වගන්ති අනුව ඔවුන් පැය 72ක කාලයක් රඳවා ප්‍රශ්න කිරීමට පොලීසිය අධිකරණ නියෝග ලබා ගත් නමුත් සාක්ෂි විශ්ලේෂණය ඇතුළු කරුණු සලකා බැලීමේදී එම කාලය ප්‍රමාණවත් නොවන බැවින් මේ තීරණය ගනු ලැබූ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවැසීය.

පිට 06

## නිරෝධායන රීති කඩන්නන්ට නීතිය තදින්ම

3470ක් අත්අඩංගුවට

යුද හමුදාපති



භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්, රක්ෂණ ශ්‍රියන්ත

නිරෝධායන රීති කඩකරන පුද්ගලයන්ට එරෙහිව දැඩිව නීතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා 'දිනමිණ'ට ඊයේ (25) පැවැසීය.

පිට 06

## බක් පුර පසළොස්වක පොහොය අදයි

මහින්ද අලුත්ගෙදර

බක් පුර පසළොස්වක පොහොය දිනය අදට (26) යෙදී තිබේ.

බක්පුර පසළොස්වක පොහොය දිනක ශාසන ඉතිහාසයේ සුවිශේෂ සිදුවීම් රැසක් වාර්තා වී තිබෙන අතර බුදුරජාණන් වහන්සේගේ දෙවන ලංකාගමනය සිදු වන්නේ ද බක් පුර පසළොස්වක පොහොය දිනයක වීම විශේෂත්වයකි.

පිට 06



## සංචරණ සීමා රැකීමට කීම බීරි අලින්ට වීණා වැයීමක් ද?

පැතිර යන නව කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සංචරණය සීමා ක... ග්‍රෙගරි වැව රවුම ජනතාවගෙන් පිරී තිබූ ආකාරය.




## රිෂාඩ්ට ඇප දෙන්න



අසේල කුරුළුවංශ

...ඩ් මන්ත්‍රීවරයාට හිරිහැර නොකර ඇපයක් ලබා... ...න ලෙස ඉල්ලන බව විපක්ෂයේ ප්‍රධාන සංවිධා... ...පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ...

පිට 06

## ...ඩ් සහ රියාජ් ...අඩංගුවට ගැනීම ...ශපාලන කුමන්ත්‍රණයක්

...තිඥ රුෂ්ඩිහි හබීබ්

...ණී සේනානායක

...ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් සහ ඔහුගේ ...සොහොයුරු රියාජ් බදියුදීන් යන අයවළුන් අත්අඩංගුවට ගැනීම දේශපාලන කුමන්ත්‍රණයක් බව ඔවුන්ගේ නීතිඥවරයා වන රුෂ්ඩිහි හබීබ් මහතා නිවේදනයක් නිකුත් කරමින් පවසයි.

පිට 06

## කොවිඩ්වලින් පීඩාවට පත් වූවන්ට සහන දෙන්න අමෙරිකාවෙන් කෝටි 145ක ආධාරයක්

මහින්ද අලුත්ගෙදර

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් වූවන්ට සහන සැලසීමේ කටයුතු වෙනුවෙන් රුපියල් කෝටි 145ක (ඇමෙරිකානු ඩොලර් මිලියන 7.6) ආධාරයක් ශ්‍රී ලංකාවට පිරිනැමීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය පියවර ගෙන තිබේ.

පිට 06

## රිෂ... අත්... ප්‍රහ...

ඇමැති, ආචාර්ය සරත් වීරසේකර

සුභාෂිණී සේනානායක

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් හා රියාජ් බදියුදීන් අත්අඩංගුවට ගනු ලැබුවේ පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය එල්ල කළ ස්වයං ඝාතකයන් සමඟ සම්බන්ධතාවක් පවත්වමින් ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට අවශ්‍ය මුදල් උපයා ගැනීමට ආධාර අනුබල දුන් බවට කරුණු අනාවරණය වීමෙන් අනතුරුව යැයි මහජන ආරක්ෂක ඇමැති විශ්‍රාමික රියර් අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකර මහතා මාධ්‍යයට ඊයේ (25) පැවැසීය.

පිට 06

## රිෂාඩ් අත්අඩංගුවට ගැනීම සම්ප්‍රදායට පටහැණියි

ජාජබ මන්ත්‍රීනි හරිනි අමරසූරිය

නුවන් හෙට්ටිආරච්චි

කථානායකවරයා දැනුම්වත් නොකර රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා අත්අඩංගුවට ගැනීම සම්ප්‍රදායට පටහැනි බවත් මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධව කුතුහලයක් ඇති බවත් ජාතික ජන බලවේගයේ මන්ත්‍රීනි හරිනි අමරසූරිය මහත්මිය 'දිනමිණ'ට ඊයේ (25)පැවසුවාය.

පිට 06

## රාජ්‍ය උත්සව නතර කරයි

නුවන් කොඩිකාර

ඉදිරි දෙසතිය ඇතුළත පැවැත්වීමට සංවිධාන කර තිබූ සියලු රාජ්‍ය උත්සව කොවිඩ් 19 ව්‍යාප්තිය පාලනය

පිට 6

රිෂාඩ් අත්අඩංගුවට ගන්න තීරණය කළේ

ජනපති හෝ කැබිනට්






## ලිට්රෝ සමාගම නව ගෑස් සිලින්ඩරයක් හඳුන්වා දීම ගැන

## එ ජා මානව හිමිකම් කමිටුවට